# පධානඝර වේදිකාව ගල්කණු මත ඉදිකිරීම පිළිබඳ විමසුමක්
## (වේදිකාව ගල්කණු මත කර ඇති රිටිගල පධානඝර ඇසුරින්)

ජේ.එම්. ඉන්දික රුවන් කුමාර

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයානාංශය, රජරට විශ්වවිද්‍යාලය. indikanethruwan@gmail.com

ප්‍රමුඛ පදඃ පධානඝර, රිටිගල, සිසිලස, ජලය, ගල් කණු

### හැඳින්වීම

බෞද්ධ සංඝාරාම පිළිබඳ සැලකීමේ දී විවිධ ආකාරයේ ආරාම සංකීර්ණයන් හඳුනාගත හැකිය. එකී සංඝාරාම වර්ග අතර වනවාසී භික්ෂූන් වෙනුවෙන් ඉදි වූ පදානඝරාරාමවලට හිමිවන්නේ ප්‍රධාන ස්ථානයකි. වෙහෙරබැදිගල, තන්තිරිමලේ, අනුරාධපුර බටහිරාරාමයේ, කිරලාගල, රිටිගල, අරංකැලේ ආදි ස්ථානවල මෙම ආකෘතියේ විහාර හඳුනාගත හැකිය. පදානඝර පිළිබඳව තොරතුරු සපයන සාහිත්‍ය මූලාශ්‍රයන් ලෙස මහාවංශය, සමන්තපාසාදිකාව, රසවාහිණිය, පාලි බෝධිවංශය හා දම්පියා අටුවා ගැටපදය මෙන්ම පෙරිමියන්කුලම, මැදිරිගිය ටැම් ලිපිය, මන්නාරම කච්චේරි ලිපිය, අනුරාධපුර පුවරු ලිපිය ආදි ශිලා ලේඛන මූලාශ්‍රයන් වැදගත් වේ[2]. මේ පිළිබඳව අධ්‍යයනයන් එච්. සී. පී. බෙල්, හෝර්කාට් (1924), සේනක බණ්ඩාරනායක (1974), ගාමිණී විජේසූරිය සිදු කර ඇත.

එකිනෙකට වෙනස් වූ පාරිසරික තත්ත්වයන් තුළ වුවද මෙම ආරාමයන් පොදු ආකෘතියකට ඉදිකිරීම හඳුනාගත හැකි වුවත් පොදු ආකෘතියෙන් බැහැර වී අලුත් අංග එක් කළ අවස්ථා ද එක් එක් ක්ෂේත්‍ර අධ්‍යයනය කිරීම මගින් පැහැදිලි වේ. නිදසුන් ලෙස රිටිගල, කිරලාගල ආදි ක්ෂේත්‍ර වල වේදිකා තුනක් සහිත ඒවා තිබීම පෙන්වා දිය හැකි ය. පධානඝර නිර්මාණය කර ඇති එකී ස්ථාන වලට අදාල විශේෂි ලක්ෂණ ද දක්නට ඇත. මෙම විශේෂතාවයන් ඒවායේ භූමියේ පිහිටීම මත, යොදාගෙන තිබෙන අමුද්‍රව්‍ය මත, ඇතැම් අංගයන් ස්ථාන ගත කර ඇති ආකාරය මත පදනම් වේ. මෙම විවිධත්වය එක් එක් ක්ෂේත්‍රය අතර පමණක් නොව එකම ක්ෂේත්‍රයේම ද හඳුනාගත හැකි ය. ඇතැම් විවිධත්වයන් භූමියේ පිහිටීම නිසා එයට උචිත ලෙස ඉදිකිරීමේ දී ඇති වූවා සේ සැලකිය හැකි වූවත් සෑම විවිධත්වයක්ම එම හේතුව මතම පදනම් වූ බව නිගමනය කළ නොහැක. එලෙස සැලකිය නොහැකි තත්ත්වයක් රිටිගල පධානඝර ආශ්‍රිතව වේ. එහි ද්විත්ව වේදිකා සහිත ආරාම මෙන්ම ත්‍රිත්ව වේදිකා සහිත පධානඝරාරාම ද වේ. එසේම මෙහි වන පධානඝරයක එක් වේදිකාවක් පමණක් ගල්කණු මත ඉදිකිරීමක් හඳුනාගත හැකි ය. මෙම තත්ත්වය අරන්කැලේ ආශ්‍රිතව ද හඳුනාගත හැකි වේ. රිටිගල ආශ්‍රිතව එලෙස නිර්මාණය කිරීමට බලපාන ලද්දේ කුමන අවශ්‍යතාවයක් හේතුවෙන් දැයි අධ්‍යයනය කිරීම ඉතා වැදගත් වේ.

### ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ දී දත්ත රැස්කිරීමේ දී පූර්ව පර්යේෂණ අධ්‍යයනය හා ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් දත්ත ලබාගත් අතර එම දත්ත මත පදනම් වී දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී. දත්ත ඉදිරිපත් කිරීමේ දී එම දත්ත හමුවන ක්ෂේත්‍ර වල විවිධත්වය

---

[2] ජයසේකර.2016 (A).44

පදනම් කරගනිමින් සන්සන්දනය කරමින් ඉදිරිපත් කිරීම සිදු කරයි.

**ප්‍රතිඵල සාකච්ඡාව**

පධානඝරයක මූලික සැලැස්ම ගත් විට එය වේදිකා දෙකකින් සමන්විත වන අතර මෙම වේදිකාවන් දෙක එකිනෙකට සම්බන්ධ කරන පාලමක් ආකාරයෙන් විශාල ගල් පතුරක් යොදා ඇත. එසේම මෙම ආරාම නිර්මාණය වන ගල් තලා ආශ්‍රිතව සිසිලස් බව, සතුන් ගෙන් වන හානි අවම කර ගැනීමට හා අවශ්‍ය ජල අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා දිය අගලක්, පොකුණක් නිර්මාණය කර ඇත. ඊට අමතරව මෙහි සිසිලස් බව සඳහා ලී දඬු හා කොළ අතු යොදා ගනිමින් සෙවිලිකරමින් පන්නසාලාවක් තැනීම වශයෙන් නිර්මාණය කරන්නට ඇති බව විශ්වාස කරයි[3]. මෙම ලක්ෂණය අනුරාධපුර බටහිරාරාමය ආශ්‍රිතව බහුලවම දැකිය හැකි වන්නේ ගල්තලාවන් කේන්ද්‍ර කරගනිමින් ඉදිකර ඇති බැවිණි. වියළි කලාපයේ වන මෙහි ගල්තලාවන් දිවාකාලයේ හිරු රශ්මිය හේතුවෙන් වන රත්වීම මත ඇතිවන උෂ්ණත්වය පාලනය කිරීමට එය වටාම ජලය රඳවා ගැනීම අත්‍යවශ්‍ය කාරණයක් වේ. කිරලාගල මෙම තත්ත්ව යම් ප්‍රමාණයකට වෙනස් වේ. එහි සිසිලන පද්ධතියක් වශයෙන් ජලය රඳවා ගැනීමට කටයුතු කිරීමට වඩා ඇති ජල අවශ්‍යතාවලට මූලිකත්වය දී ඇත. ඒ අනුව ජලය යොදාගත් විශේෂිත වූ සිසිලන පද්ධතියක් ඒ ආශ්‍රිතව දක්නට නොවේ.

ආරාම ආශ්‍රිතව සිසිලස් බව සුරැකීම සඳහා එය යට හා වටා ජලය රඳවා ගත් අවස්ථා දක්නට වේ. නිදසුන් ලෙස අරන්කැලේ පධානඝර යට ජලය රඳවාගත හැකි ලෙස නිර්මාණය කර තිබීමත්, උක්ත විස්තර කළ ආකාරයට සිසිලස් බව රැක ගැනීම ද කටයුතු කර ඇති ආකාර දැකිවිය හැකි ය. අභ්‍යන්තරයේ ජලය රඳවා සිසිල් බව ඇතිකිරීමට ගල් කණු මත වේදිකාවක් කර වටෙන්ම ගල් පතුරු යොදා ගනිමින් සකස් කිරීම සිදු කරන්නට ඇතැයි යන්න ඉදිරිපත් වී ඇති ප්‍රධානතම උපකල්පනය වේ. නමුත් මෙම උපකල්පනය රිටිගල ආශ්‍රිතව කෙතෙක් දුරට සාධාරණ ද යන්න විමසීම වටී.

රිටිගල යනු ස්වභාවික ජල මූලාශ්‍රයන් බහුලව ම වන හා වියළි කලාපයේ වැඩිම වර්ෂාපතනය ලැබෙන ප්‍රදේශයයි[4]. රිටිගල කඳු මුදුණ නිරන්තරයෙන් තුෂාරයෙන් වැසී තිබෙන අතරම නිරිත දිග මෝසම් කාලවල දී සිදුවන අධික වාෂ්පී ස්වභාවය හෙවත් පහල ප්‍රදේශවල නියන් පවතින අවස්ථාවක දී වුවද රිටිගල කන්ද තෙතමනයෙන් යුක්ත වේ[5]. ඒ අනුව මෙහි ජල හිගයක් දක්නට ද නොවේ. එසේම විශාල පධානඝරාරාම සංකීර්ණයක් වන මෙහි සෑම පධානඝරයක් දෙපසින්ම ස්වභාවික දිය පහරක් ගලා යාම[6] දක්නට ඇත. එබැවින් විශේෂිත සිසිල් කිරීමේ ක්‍රමවේදයක් ලෙසට ජලය යොදා ගැනීමක් කිරීම අවශ්‍ය නොවේ. නමුත් අරන්කැලේ, බටහිරාරාමය ආදි ස්ථානවල ජලය සිසිලස් බව ඇති කිරීමට යොදා ගෙන තිබෙන බව පැහැදිළි ය. එසේම කළුදිය පොකුණ හා තන්තිරිමලේ ක්ෂේත්‍ර ආශ්‍රිතව වන පධානඝර ආරාම අසලම තරමක් විශාල ජල තටාකයන් වීම එහි සිසිල් බව සුරැකෙන්නට හේතු වන්නට ඇත. නමුත් රිටිගල වැනි ප්‍රදේශයක සිසිලත් බව ආයාසයකින් ඇති කළ යුත්තක් නොවේ. එහි ස්වභාවික පරිසරයේම එම සිසිලස් බව නිතැතින් රැඳී ඇත. ඒ අනුව ජලය පධානඝර ආශ්‍රිතව රඳවා ගැනීමක් තුළින් සිසිලස් බවක් ඇතිකිරීම අවශ්‍ය නොවේ. මෙලෙස එක් පධානඝරයක පමණක්

[3] ද සිල්වා. 1998. 308

[4] ජයසේකර .2016 (B). 93
[5] අලහාකෝන්.2011. 07
[6] ජයසේකර .2016 (B). 93

ජලය රදවා ගැනීමට ගල් කණු මත වේදිකාව ඉදිකිරීම ද පැහැදිලිව පිළිගැනීමට නොහැකි අදහසකි. මන්ද යත් එකම ක්ෂේත්‍රයේ අනෙකුත් පධානඝර ආරාමයන්වල එලෙස දක්නට නොවීමත්, ජලය රදවා ගැනීමට නම් එකම ක්ෂේත්‍රයේ වන අනෙකුත් පධානඝරවලට ද එම අවශ්‍යතාවය එලෙසම පැවැතිය හැකි බැවිණි.

රිටිගල ගල් කණු මත ඉදිකරන ලද පධානඝර දක්කට ලැබෙනුයේ ආරාම සංකීර්ණයේ ඉහළට වන්ට ය. එසේම එය අනෙක් ආරාම මෙන් භූමියේ දැඩි විෂමතාවයක් සහිත ස්ථානයක ඉදි කරන ලද්දක් ද නොවේ. මෙහි වේදිකා තුනක් දක්නට ලැබෙන අතර එය වටා ම බැම්මක් නිර්මාණය කර ඇත. එම බැම්මේ උස් මට්ටමෙන් සක්මන් මළු දක්නට ලැබේ. ප්‍රධාන ප්‍රවේශ මාර්ගයේ වන පියගැට පෙළ මෙහි බිම් මට්ටමෙන් නිර්මාණය වී ඇත. එහි ජලය ගබඩා කළේ නම් මෙම ප්‍රවේශ මාර්ගය දිගේ අතිරික්ත ජලය ගලායාමක් සිදු විය හැකි ය. මෙය ප්‍රමාණයෙන් විශාල වේදිකා සහිත වන බැවින් මෙහි වන ප්‍රධාන වේදිකාවට ගල් පතුරු ඇතිරීමේ දී ගල් පාලම් ඉදිකිරීමේ දී යොදාගත් ලෙසට ගල් කණු යොදා කුඩා ගල් පතුරු ඇතිරීමක් කළේ ද යන්න පිළිබඳව ද අවධානය යොමු කිරීම වැදගත් වන්නේ අරන්කැලේ එවැනි ලෙස නිර්මාණය කළ පධානඝරයක් හඳුනාගත හැකි වන බැවිනි. නමුත් රිටිගල විශමතා සහිතවන භූමි සහිත ස්ථානවල ගොඩනැගිලි ඉදිකර ඇති ආකාරය අනුව මෙම පධනඝරය ඇති ස්ථානයේ ඉතා පහසුවෙන් එය නිර්මාණය කිරීමට හැකි බව පැහැදිලිව හඳුනාගත හැකි ය. එබැවින් මෙය වෙනත් විශේෂ අවශ්‍යතාවයක් මත ඉදිකරන ලද්දක් බව උපකල්පනය කිරීම සාධාරණය. මන්ද යත් අරන්කැලේ ත් සෑම පධානඝරයක් ම ඉදිකිරීමේ දී ගල් කණු යොදා වේදිකාවක් ඉදිකර නොමැති අතර රිටිගල ක්ෂේත්‍රය සැලකූ විට ද එක් පධානඝරයක් තුළ පමණක් මෙය විශේෂි ලෙස දක්නට වීමයි.

මේ අනුව රිටිගල වන ගල්කණු මත එක් වේදිකාවක් ඉදිකර ඇති මෙම ත්‍රිත්ව වේදිකාවෙන් යුතු පධානඝරය එක් වේදිකාවක් එලෙස ඉදිකිරීම ජලය රඳවා ගැනීමට නොවන බව පැහැදිලි ය. එසේම ගල් පාලම් ඉදිකරන ලද ක්‍රමවේදය යොදාගෙන ගල් ලෑලි ඇතිරීමට වඩා එහි භූමි පිහිටීම මත ඉතා පහසුවෙන් ගල් ඇතිරීමට හැකි බව ද පැහැදිලි කරුණකි. ඒ අනුව එක් පධානඝරයක පමණක් මෙලෙස විශේෂත්වයක් ඇති ලෙස ගල් කණු මත වේදිකාවක් ඉදිකිරීමට යම් ආකාරයකි විශේෂිත වූ විනයකර්මයක්, චාරිත්‍රයක් ඉටු කිරීමට, වෙන යම් සම්ප්‍රධායක බලපෑමක් හෝ වෙනත් විශේෂිත හේතුවක් බලපාන්නට ඇතැයි උපකල්පනය කිරීම සාධාරණය. මෙම උපකල්පණ පිළිබඳ පර්යෙෂණ සිදුකර සැබෑ අවශ්‍යතාවය කුමක් ද යන්න හඳුනාගැනීම වැදගත් වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


අලහාකෝන්, උදිත.2011. ***රිටිගල.*** මධ්‍යම සංස්කෘතික අරමුදල ප්‍රකාශනයකි.

ජයසේකර.ජේ එම් අයි ආර් කේ. 2016 (A). *පදානඝර ආරාමයන් හා බද්ධ ස්වභාවික පරිසරය.* ***Proceeding of Undergraduate Research Symposium on Archaeology.*** Society Of Archaeology, Department of Archaeology & Heritage Management, Faculty Of Social Sciences & Humanities, Rajarata University Of Sri lanka, Mihinthale. (44)

ජයසේකර.ජේ එම් අයි ආර් කේ. 2016 (B). *පධානඝර ආරාම සංකීර්ණ ආශ්‍රිත ජල කළමනාකරණය.*